**ජාතික සමාජ සංවර්ධන ආයතනය**

(කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය)

තනතුර : අධ්‍යක්ෂ (සමාජ සේවා විද්‍යාලය) තනතුරු 01

1. වයස් සීමාව : අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 25 ට නොඅඩු හා 50 ට නොවැඩි විය යුතු ය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

2. අධ්‍යාපන සුදුසුකම් : **බාහිර අයදුම්කරුවන්**

අ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් සමාජීය විද්‍යාවන්ගෙන් ප්‍රථම උපාධිය සමග සමාජ වැඩ (Social Work) පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම;

ආ. රාජ්‍ය සේවයේ, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ රජය පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර (15) සමාජ වැඩ අධ්‍යාපන කළමනාකරණ අංශයන් හි පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) ජාතික සමාජ සංවර්ධන ආයතනයේ සමාජ වැඩ අධ්‍යාපන කළමනාකරණ සේවා ගණයේ තනතුරක I ශ්‍රේණියේ අවම වශයෙන් වසර 05 ක පළපුරුද්දක් තිබීම.

3. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු ක්‍රමය :

| | *නිර්නායකය* | *ලකුණු* |
|---|---|---|
| 1 | අධ්‍යාපන සුදුසුකම් (මූලික සුදුසුකම්වලට අතිරේකව) | 30 |
| 2 | අදාළ අතිරේක පළපුරුද්ද | 30 |
| 3 | වෙනත් කුසලතා | 15 |
| 4 | සම්මුඛ පරීක්ෂණයේ කාර්ය සාධනය | 25 |
| | **එකතුව** | **100** |

4. වැටුප් පරිමාණය : HM 1-3 -(රු.86,865-15X2,270- රු.120,915).

5. තනතුර සඳහා සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :

1. සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතු ය.
2. තනතුර ස්ථිරය.
3. රජයේ අනුමත ප්‍රතිශතයන්ට අනුව සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.
4. තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

සටහන : මෙම තනතුර පුරප්පාඩුව පවතින්නේ සීදූව ප්‍රධාන කාර්යාලයේ වන අතර තෝරා ගන්නා අය ප්‍රධාන කාර්යාලයේ සේවය කළ යුතු ය.

සේවා කොන්දේසි : 1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ විධිවිධානවලට හා රජය විසින් වරින්වර පනවනු ලබන නීති රීති හා රෙගුලාසිවලට යටත් විය යුතු ය.

බඳවා ගැනීමේ ක්‍රමවේදය : පත්වීම් බලධාරියා විසින් නියම කරනු ලබන පරිදි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව තෝරා ගැනීම සිදු කෙරේ.

අයදුම්කරුවන් සම්පූර්ණ ජීවදත්ත තොරතුරු ඇතුළත් අයදුම්පත් පහත ලිපිනයට **2024.11.22 දින** හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම් කරන තනතුර ලිපිකවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ අපැහැදිලි හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රාජ්‍ය අංශයේ සේවයේ නියුතු නිලධාරීන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

ආචාර්ය රවීන්ද්‍ර විතානාච්චි,
අධ්‍යක්ෂ ජනරාල් (*වැ. බ.*)
ජාතික සමාජ සංවර්ධන ආයතනය.

2024 නොවැම්බර් මස 04 වැනි දින,
අධ්‍යක්ෂ ජනරාල් (*වැ. බ.*),
ජාතික සමාජ සංවර්ධන ආයතනය,
ලියනගේමුල්ල,
සීදූව.

11-171